# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/41 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වන දින,
නුවරඑළිය,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මේ නියෝග, 1975 අංක 4 දරන හදිසි අවස්ථා (ආරක්ෂාව සහ මහාජන සාමය පවත්වා ගෙන යාමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) යම් ප්‍රසිද්ධ රැස්වීමකට හෝ යම් පෙරහැරක් හෝ පෙළපාළියක් පැවැත්වෙන අවස්ථාවක පැමිණ සිටියදී කිසිම තැනැත්තකු විසින් යම් තුවක්කුවක් ගෙන යැම හෝ දක්වීම නොකළ යුතුය.

(ආ) කිසිම තැනැත්තකු විසින්—

(i) වෙනත් තැනැත්තන් තුවක්කු පාවිච්චි කිරීමෙහි පුහුණු කිරීම හෝ සරඹ කරවීම හෝ තමා තුවක්කු පාවිච්චි කිරීමෙහි පුහුණු කරවනු ලැබීමට හෝ සරඹ කරවනු ලැබීමට ඉඩදීම නොකළ යුතුය ; නැතහොත්

(ii) තුවක්කු ගෙන යමින් සිටියදී යම් හමුදා පෙළ ගැස්වීම් හෝ යම් සරඹ හෝ වෙනත් ඒ හා සමාන අභ්‍යාසයක් කිරීමට වෙනත් තැනැත්තන්ට විධාන කිරීම හෝ උපදෙස් දීම, නැතහොත් තුවක්කුවක් ගෙන යමින් සිටියදී යම් හමුදා පෙළ ගැස්වීම් හෝ යම් සරඹ හෝ වෙනත් ඒ හා සමාන අභ්‍යාසයක් කිරීමට තමාට විධාන කරනු ලැබීමට හෝ උපදෙස් දෙනු ලැබීමට ඉඩදීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

3. 2 වන නියෝගයේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කරන හෝ කඩ කළ යම් තැනැත්තකු, පොලිස් බලකායේ යම් සාමාජිකයකු විසින් හෝ සන්නද්ධ සේවාවල යම් සාමාජිකයකු විසින් වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගෙන, ඒ තැනැත්තාගේ සන්තකයෙහි තිබී සොයා ගනු ලබන යම් තුවක්කුවක් තම භාරයට ගත හැකිය.

4. 2 වන නියෝගයේ විධිවිධාන කිසිවක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන අතර, එම වරද කරන වේලාවේදී ඔහුගේ සන්තකයෙහි තිබී සොයා ගනු ලබන යම් තුවක්කුවක් අහිමි කරනු ලැබීමට ද ඔහු යටත් වන්නේය.

5. 4 වන නියෝගය යටතේ වරදක් කිරීමේදී වෙන යම් තැනැත්තකුට ආධාර දෙන හෝ අනුබල දෙන යම් තැනැත්තෙක් ද වරදක් කරන අතර ඒ නියෝගය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තකු මෙන් ඒ දණ්ඩනයටම ඔහු යටත් වන්නේය.

6. අත් අඩංගුවෙහි තබා ගනු ලැබ ඇත්තාවූද මේ නියෝග යටතේ වරදක් පිළිබඳව සැක කරනු ලැබ හෝ චෝදනා නඟනු ලැබ ඇත්තාවූ ද යම් තැනැත්තකු, කිසිම අධිකරණයක් විසින්, නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව ඇප පිට මුදා හරිනු නොලැබිය යුතුය.

7. 2 වන නියෝගයේ විධිවිධාන පොලිස් බලකායේ යම් සාමාජිකයකු හෝ සන්නද්ධ සේවාවල යම් සාමාජිකයකු හෝ ශ්‍රී ලංකා ශිෂ්‍ය භට බලකායේ යම් සාමාජිකයකු කෙරෙහි අදාළ නොවන්නේය.

8. මේ නියෝගවල " තුවක්කු " යන්නට යම් රයිෆලයක්, කුඩා තුවක්කුවක්, පිස්තෝලයක් සහ අනුවාංශ තුවක්කුවක් රිවෝල්වරයක් ඇතුළත් වේ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

I11 A——ඒ 13667—2,100 (75/04)